# නීති සංකල්පය සහ නීතිය පිළිබඳ බෞද්ධ ආකල්පය

ඇහැලේපොල මහින්ද හිමි

Law is the ethically reputed conceptual system which prevails continuously from the most primeval states to present time of human. The Law is connected with each and every incident of people from birth to death. The Law means continuously following-on the common law which was ordered by ancient kings. Law is the feminine word and gives the meanings like Law, Precept, following prescriptions, Ruling constitutions, Science of Constitutions, etc. The word Law is equally used in Pāli and Sanskrit. Guidance, Admonition, Practice, Ritual, Exercise, Conduct, endurance are the meanings in a broader context for Law. Buddhists introduce the Law as Enactment (paňňatti). There Enactment is related with Vinaya (disciplines). Vinaya was enacted by Lord Buddha and Law is executed by King. King's Responsibility is executing law for good attitudes and behavior of human and society, and Buddha's sanction was to following that law without overcoming it. In Buddhist society Precepts represents the synonym for Law. Precepts are the Enactments. Lord Buddha's prescription was to regarding Vinaya as the Teacher after the passing away of Buddha.

## ප්‍රවේශය

නීතිය යනු මානව වර්ගයාගේ ආදිත ම අවස්ථාවේ සිට නූතනය දක්වා ම නොසිඳී පවතින ආචාර විද්‍යාත්මක සම්මත සංකල්ප පද්ධතියකි. මිනිසාගේ උපතේ

සිට මරණය දක්වා ම සෑම සංසිද්ධියකට ම නීතිය සම්බන්ධ වී ඇත. පළමු රජදරුවන් විසින් නියම කරන ලද ව්‍යවහාර යුක්ති නොකඩ කොට එලෙස ම පැවැත්වීම නීතිය නම් වේ. ස්ත්‍රීලිංග පදයක් වන 'නීති' යන්නෙන් නීතිය, ශික්ෂාපදය, පිළිපැදිය යුතු නියමය, පාලනයට අවශ්‍ය ව්‍යවස්ථා, ව්‍යවස්ථා උගන්වන විද්‍යාව යන අර්ථ නිරූපණය කෙරේ. නීති යන්න පාලි හා සංස්කෘතයෙහි සමානව යෙදේ. Guidance - මඟපෙන්වීම, අනුශාසනාව, Practice - සිරිත, ආභාසය, Conduct - චර්යාව, පැවැත්ම වැනි පුළුල් පරාසයක අර්ථ ද නීති යන්නෙන් ප්‍රකට ය.

නීතිය බෞද්ධයන් විසින් හඳුන්වනු ලබන්නේ පැනවීම (පඤ්ඤත්ති) යනුවෙනි.[1] මෙහිදී පැනවීමට අයත් වන්නේ විනය යි. විනය යනු බුදුන් වහන්සේ විසින් පනවන ලද්දක් වන අතර නීතිය යනු රජු විසින් සම්පාදනය කරන්නකි. පුද්ගලයාගේත් සමාජයේත් යහපත් චින්තනය සහ චරණය පිණිස නීති සම්පාදනය කිරීම රජුගේ වගකීම වන අතර එකී රාජ නීතිය නො ඉක්මවා එයට අනුගතව සිටීමට බුදුරදුන් භික්ෂූන්ට අනුදක්නා ලදි.[2] බෞද්ධ සමාජය තුළ නීති යන්නෙහි පර්යාය පදයක් වශයෙන් ශික්ෂාපද දැක් වේ. ශික්ෂාපද යනු විනය ප්‍රඥප්තීන් ය. විනය බුදුරදුන්ගෙන් පසුව ශාසනයෙහි ශාස්තෘවරයා වන බව බුද්ධ නියමය වෙයි. පුද්ගලයාගේ සහ සමාජයේ අයහපත් කටයුතු හා ක්‍රියාවන් යාමනය පිණිස මිනිසා විසින් භාවිත සම්මත පොදු නියමයන් අතර නීතිය වැදගත් වේ. නීතිය පිළිබඳ ව ප්‍රසිද්ධ වර්ගීකරණ තුනකි.

ලෝකනීතිය (චාරිත්‍රානුගත නීතිය)

ධර්මනීතිය (ආගමික නීතිය)

රාජනීතිය (පැන වූ නීතිය)[3]

නීති සංකල්පය ප්‍රභවයවීමට සිරිත්විරිත් ආදි චාරිත්‍රානුකූල නීතිය හෙවත් ලෝක නීතිය මුලින් ම ඉවහල් වී ඇත. ලොව පවතින සෑම නීතියක ම කර්තෘත්වය ඒ ඒ සමාජ සංස්කෘතිය විසින් ආගමට පවරා ඇත. ආගමික නීතිය හෙවත් ධර්ම නීතිය ලොව සෑම තැනක ම ක්‍රියාත්මක වන්නකි. ආගමෙන් ආගමට ධර්ම නීතිය වෙනස් වේ. යුරෝපීය රටවල ක්‍රිස්තියානි ආගම නීතියෙහි මූලාශ්‍රයක් වශයෙන් ද පෙරදිග සහ අප්‍රිකානු රටවල බෞද්ධාගම, ඉස්ලාම් සහ හින්දු ආගම් ඒ ඒ කලාපවල නීතියෙහි මූලාශ්‍රයක් වශයෙන් සැලකේ. මේ අනුව ධර්මනීතිය නීති සංකල්පයේ මූලාරම්භක අවස්ථාව නියෝජනය කරයි. ආගමික නීතිය (ධර්මනීතිය) රටක පැවතුණ ද තත් ආගමික නීතිය අදාළ වන්නේ රටේ එම ආගම අදහන අයට පමණි. අනෙක් ආගම් අදහන අයට එම ආගමික නීතිය නොබලපායි. රටක පාලකයා විසින් පනවන නීතිය රාජ්‍ය නීතිය වේ. එය රටේ පොදු නීතිය ද වේ. එබැවින් ධර්මනීතියට (ආගමික නීතිය) වඩා රාජ නීතිය පොදු ජනතාවගේ පොදු ජන ජීවිතය සඳහා ඉවහල් වේ.

බෞද්ධ නීතිය අයත් වන්නේ මෙම ධර්ම නීතිය හෙවත් ආගමික නීතියට ය. බෞද්ධ නීති පද්ධතිය තුළ රාජ්‍ය නීතියට අදාළ වටිනා නීති මූලාශ්‍රය රැසක් හමු වේ. බෞද්ධ නීතිය විනය පිටකාගත ගිහි-පැවිදි විනය ශික්ෂාපදවලට පමණක් සීමා

නොවේ. විනය පිටකාගත ශික්ෂාපදවලට අමතර ව ජාතකපාළිය, ධම්මපදපාළිය ආදි සූත්‍ර පිටකාගත උපදේශනාත්මක දේශනාවන් ද බෞද්ධ නීති වශයෙන් පිළිගනි. එහෙත් ඒවායෙහි සාකච්ඡා කෙරෙන සංකල්ප බෞද්ධ නීතිය යනුවෙන් සැලකුව ද ඒවා බෞද්ධ විනය ශික්ෂාවන් නොවීම විශේෂත්‍වය යි. බෞද්ධ නීති ග්‍රන්ථ ආගමික නීතිය හෙවත් ධර්මනීති කොටසට අයත් වුව ද පොදු ජනජීවිතය හා සබැඳි රාජ නීතිය (රජු පනවන ලද නීතිය) මෙන් ජනජීවිතයෙහි විශේෂ කොටසක් බවට ද පත් වී ඇත. ධම්මපදය, ජාතක ආදි ත්‍රිපිටකාගත බෞද්ධ උපදේශ මාලාවන් ඇසුරින් සකස් වූ නිසා එය ගිහි පැවිදි සියලු ම සමාජ දේහයට අවශ්‍ය කරන මගපෙන්වීම බෞද්ධ නීති ග්‍රන්ථ සාහිත්‍යයෙන් සිදු වේ. මෙයට අමතර ව ලොව පුරා විවිධ නීති පද්ධති රැසක් දැකිය හැකිය.

රෝම ලන්දේසි නීතිය

ඉංග්‍රීසි නීතිය (එංගලන්ත නීතිය)

හින්දු නීතිය

මුස්ලිම් නීතිය

රෝම-ලන්දේසි මෙන් ම ඉංග්‍රිසි නීතියෙහි සංකලනයක් වන ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින නීතිය තුළ බෞද්ධ නීති සංකල්පයට යටත් ව උඩරට විවාහ නීතිය සහ පහතරට විවාහ නීතිය යනු සිංහල බෞද්ධ සංස්කෘතිය විසින් නිපදවා ඇති නීති පද්ධති දෙකකි. ථේරවාදී බෞද්ධ රටවල බෞද්ධ නීතිය යටතට ගැනෙන පාලි නීති ග්‍රන්ථ සාහිත්‍ය විශේෂයෙන් ම බුරුමය, තායිලන්තය, ලාඕසය වැනි අග්නිදිග ආසියානු රටවල ප්‍රබල ව සමාජගත වී ඇත. ශ්‍රී ලංකාව තුළ ධම්මපදය බෞද්ධයන්ගේ අත්පොත වන්නාක් මෙන් බුරුමයේ පාලි නීති ග්‍රන්ථ සාහිත්‍යාගත ලෝකනීති, ධම්මනීති, මහාරහනීති ආදි නීති ග්‍රන්ථ ඔවුන්ගේ අත්පොත් ලෙස භාවිත කෙරේ.

පුද්ගලයාගේ සහ සමාජයේ පරිහානිය වළක්වාලමින් එහි යහපැවැත්ම හා ආරක්ෂාව සඳහා සකස් වූ රීති මාලාව නීතිය වන අතර මෙම සාමාන්‍ය පොදු නීතින් රටකින් රටකට පාලන තන්ත්‍රයකින් පාලන තන්ත්‍රයකට වෙනස් විය හැකිය. බෞද්ධ නීති සංකල්පය භූගෝලීය, සමාජීය මෙන් ම දේශපාලනමය විවිධත්වයක් මත නොවෙනස් වන්නකි. පණ්ඩිත වූ ද සිල්වත් වූ ද මෘදු වූ ද වැටහීම ඇත්තා වූ ද උඩඟු නොවූ තැනැත්තේ යසස් ලබන බව බුද්ධ නීති සංග්‍රහයේ දැක්වේ.

"පණ්ඩිතො සීලසම්පන්නො ගණ්හො ච පටිභාණවා
නිවාත වුත්ති අත්ථද්ධො තාදිසො ලබතෙ යසං''[4]

උක්ත බෞද්ධ නීති නියාමය සාමාජීය, භූගෝලීය මෙන් ම දේශපාලන විවිධත්වය හමුවේ වෙනස් නොවේ. සාමාන්‍ය නීතිය රටකින් රටකට සමාජයෙන් සමාජයට වෙනස් වුව ද බෞද්ධ නීති නියාමයන් එලෙස වෙනස් නොවීම බෞද්ධ

නීතිය සතු සුවිශේෂත්වයකි. බෞද්ධ නීතිය පනවන ලද්දකි. (පඤ්ඤත්ති)[5] සාමාන්‍ය පොදු නීතිය හෙවත් සිවිල් නීතිය යනු සම්පාදනය වූවකි. වරදකරුවා, වරදකරුවෙකු කොට දඬුවම පදනම් කරගෙන දඬුවමෙන් කෙලවර වන අයුරින් සාමාන්‍ය පොදු නීතිය ක්‍රියාත්මක වේ. බෞද්ධ නීතිය වරදකරුවාට වරද අවබෝධ කර දී දඬුවමෙන් බේරීමට මඟ කියා දෙන්නකි. බෞද්ධ නීති සංකල්පය දඬුවම ප්‍රතික්ෂේප කරන අතර එය සීලය සමග අන්තර් සම්බන්ධ ය. බෞද්ධ නීතිය උල්ලංඝනය කිරීම මත දඬුවමට වඩා අකුසලයක් සිදුවෙන බව ඉගැන්වීම ද බෞද්ධ නීතියෙහි විශේෂත්වයකි. සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. එබැවින් තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය, නොනැසවිය යුතු ය.[6] යනු බෞද්ධ නීතියෙහි අනන්‍ය ලක්ෂණයකි.

බෞද්ධ නීති පද්ධතිය දඬුවම කේන්ද්‍ර කර නොගෙන කුසලය සහ අකුසලය පදනම් කරගෙන (සිල් රැකීමේ අනුහස් පැහැදිලි කරමින්) විකාශය[7] වී ඇත. පඨමාභිසම්බෝධියෙන් පසුව පැන වූ විනය ශික්ෂාපදවලට අයත්ව දඬුවම නිර්දේශිතව පැවතුණි ද එමඟින් කායික හිංසනයට වඩා මානව අයිතීන් සුරක්ෂිත කරමින් අර්ථ සම්පන්න සදාචාරවත් නිර්මල සමාජයක් ඇති කරලීම අපේක්ෂා ව විය. වරදට දඬුවම අනුමත කිරීම බුදුසමය පිළිගන්නේ වරදකරු නිවැරදිකරු කිරීමේ පරමෝත්කෘෂ්ට පරමාර්ථයෙනි. සාමාන්‍ය සම්ප්‍රදායට අනුව දඬුවම්දීමේ පරමාර්ථ කිහිපයක් සඳහන් වේ.

1. පෙරළා පහරදීම
2. සමාජයට ආදර්ශයක් ලබාදීම
3. වරදකරු නිවැරදිකරු කිරීම[8]

බෞද්ධ නීතියෙහි වරදකරු නිවැරදිකරු කිරීමේ දඬුවම් කායික හිංසනයෙන් තොර ය. ඒ අතර බ්‍රහ්ම දණ්ඩනය (Ostracism) ප්‍රධාන ය. බෞද්ධ දඬුවම භික්ෂුවට පමණක් නොව ගිහි සමාජයට ද පොදු කරුණක් බව විනය පිටකයේ එන දණ්ඩ වග්ගය (ගිහි විනය) හා පාරාජිකපාළිය (පැවිදි විනය) ආදියෙන් නිරූපිත ය. වරද පිළිගෙන නැවත වැරදි නොකිරීම යන අධිෂ්ඨානය සහ පොරොන්දුව මත බෞද්ධ නීතිගත දඬුවම ජීවිතාන්තය දක්වා ක්‍රියාත්මක වන්නක් නොවේ.

බෞද්ධ සම්ප්‍රදාය තුළ නීතිය යනු 'යාවනිබ්බාන' නිවන සාක්ෂාත් කර ගන්නා තෙක් සාංසාරික ව පවතින්නකි. පොදු නීතිය 'යාවජීව' දිවි ඇති තෙක් පවතින්නකි. බෞද්ධ විනය ශික්ෂා පදානුකූල ව ජීවත්වන සත්ත්වයාට එම කුසලය නිවන් දකින තෙක් ශක්තියක් ව සංසාරික ව හේතු වේ. පොදු නීතිය ජීවිතය අවසන් වීමත් සමග ම කෙළවර වීම සාමාන්‍ය කරුණකි.

පොදු නීතිය (සිවිල් නීතිය, රාජ නීතිය) මඟින් නොදමුණු අයෙකු වෙතොත් නොදමුණු ඔහු ආයුධ ආදිය භාවිත කරමින් දමනය කිරීමට වෙහෙසෙයි. බෞද්ධ නීතිය නොදමුණු පුද්ගලයන් ''අදණ්ඩේන'' (දඬුවමකින් තොරව) ''අසත්ථේන''

(ආයුධයකින් තොරව) දමනය කරයි. සිවිල් නීතිය තුළ පුද්ගලයා දඬුවමින් හික්මවන අතර බෞද්ධ නීතිය තුළ ආධ්‍යාත්මික ව පුද්ගලයා හික්මව යි. නොහික්මුණු පුද්ගලයන් හික්මවා ගනිමින් සදාචාරාත්මක නීතිගරුක පුද්ගලයන්ගේ පැවැත්ම තහවුරු කිරීම බුදුන් වහන්සේගේ විනය ශික්ෂාපදවල සහ අනෙකුත් සූත්‍ර පිටකාගත නීති උපදේශනවලින් මෙන්ම බෞද්ධ රටවල බෞද්ධ සංස්කෘතීගේ උපදේශ පදනම් කොට ගෙන සකස් වූ බෞද්ධ නීති ග්‍රන්ථ සාහිත්‍යයෙහි ද නිරූපිත ය.[9] බෞද්ධ නීති පද්ධතිය තුළ ලෞකික වශයෙන් අර්ථ සම්පන්න සදාචාරමත් දිවි පෙවතක් ඇති කිරීම මෙන් ම ලෝකෝත්තර වශයෙන් නිවන් අවබෝධ කර ගැනීමට අවශ්‍ය කුසල් ශක්තිය ඒකරාශි කරන ප්‍රතිපත්ති පද්ධතියක් ඇති කරවීම (උභයාර්ථ සාධනය) ද විශේෂිත ය.

ලෝකනීති, ධම්මනීති, රාජනීති යන නීති ක්ෂේත්‍රයන් අතර ධම්මනීති යනු පුද්ගලයාට ධාර්මිකව (දැහැමිව) ජීවත් වීමට අවශ්‍ය සදුපදේශයන් සම්පාදනය කරවන ග්‍රන්ථ විශේෂය යි. තමා වෙත පැමිණි දුක් ඉක්මවීම, පැමිණිය හැකි දුක් වළක්වා ගැනීම, නොලැබූ සම්පත් ලබා ගැනීම, ලැබූ සම්පත් නොසිඳින්නා සේ පවත්වා ගැනීම සහ මරණින් මතු අපාගත නොවීම[10] යන කාරණා පහ ඉටු කරවා ගැනීමට මිනිසා අප්‍රමාණ වෙහෙසක් ගනී. ඉහත කරුණු පහ ඉටුකරවා ගැනීම පුද්ගලයාට අතිශය දුෂ්කර ය. ඒ සඳහා ඔහුට තීක්ෂණ නුවණක් හා ඉවසීමක් තිබිය යුතු ය. ඉහත කාර්ය සාධනයෙහි ලා තීක්ෂණ බුද්ධිය හා ඉවසීම නොමැති අය දෙලොවින් ම පරිහානියට පත් වේ. එම කාරණා පහ ඉටු කරවා ගැනීමට අවශ්‍ය මග පෙන්වාදීම සිදුකරන්නේ ධම්මනීති මඟිනි. මෙලොව පරලොව උභයාර්ථ සාධනය සඳහා පිළිපැදිය යුතු උපදෙස් ආදි මාර්ගය ධම්මනීතිය වන අතර බෞද්ධ (පාලි) නීති ග්‍රන්ථ සාහිත්‍ය කෘති දහය අතුරින් ධම්මනීතිය යටතට සුත්තන්ත නීති, ධම්මනීති, නරදක්ඛදීපනී සහ චතුරාරක්ඛාදීපනී[11] යන නීති ග්‍රන්ථ අයත් වුව ද සෙසු නීති ග්‍රන්ථ ද පුද්ගලයාට දෙලොව ශාන්තිය පිණිස අවැසි උපදේශකත්වය ලබා දේ.

චතුරාරක්ඛාදීපනීයට අයත් බුද්ධානුස්සති නිද්දේසය යනු බුදුරජාණන් වහන්සේගේ ඔවාද දේශනා ආදි උපදේශවලින් සපිරුණු ගාථා පහළොවකින් (15) යුතු කාණ්ඩයකි. පහත දැක්වෙන්නේ එහි ඇතුළත් සම්බුද්ධෝපදේශනයකි.

''ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධ සාසනෙ
ධුනාථ මච්චුනො සෙනං නළාගාරංව කුඤ්ජරො''[12]

''යො ඉමස්මිං ධම්ම විනයෙ අප්පමත්තො විහෙස්සති
පහාය ජාති සංසාරං දුක්ඛස්සන්තං කරිස්සති''[13]

මේ අනුව බෞද්ධ (පාලි) නීතිය තුළ සම්බුද්ධෝපදේශයන් එලෙස ම නියෝජනය කිරීම විශේෂත්වයකි. සිත යනු සත්ත්වයාගේ පැවැත්ම තීරණය කරන සජීවි සාධකයකි. පාලි නීති ග්‍රන්ථ සංග්‍රහයන්හි ද බුද්ධ දේශනාවන් මෙන් සිත සහ සිතෙහි ස්වරූපය විවරණය කොට ඇත. සත්ත්වයාට ශාරීරික ව රෝගාබාධ දරාගත

හැකිය. ඒවා මානසික ව ඉවසිය නොහැකිය. කායික රෝග සුවපත් වුව ද මානසික රෝග සුවපත් කිරීම අපහසු ය යන සදාතනික මානසික පොදු ලක්ෂණය බෞද්ධ නීතියෙහි ද සඳහන් වේ.

''කාය රොගං තිතික්ඛාය - චිත්ත රොගං චිකිච්ඡතු
සුඛිනො කායරොගීපි - චිත්තෙ නිරාමයෙ අපි''[14]

මෙය 'කායිකව වසර සියයක් නිරෝගීව සිටියත් මානසිකව නීරෝගීව එක මොහොතක් වත් සිටිය නොහැකිය.' යන බුද්ධෝපදේශය සිහිපත් කරවන්නකි.

පරියත්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය අතුරින් පරියත්ති ශාසනය යනු බුද්ධ දේශනාව යි. පරියත්ති ශාසනය නොමැති වූයේ නම් බුද්ධ දේශනාවන් ද ඇසිය නොහැකි ය. එබැවින් පරියත්ති ශාසනය මත බුද්ධ දේශනා ගොඩ නැඟී ඇත. සුවඳ මල් ආදියෙන් බුදුරජාණන් වහන්සේට පුදපූජා පවත්වනවා වෙනුවට බුදුන් වහන්සේගේ බුද්ධ දේශනාව අවබෝධ කර ගැනීම වන්දනාමානවලට වඩා උතුම් වූවකි.

''පරියත්තිං විනා සෙය්‍යං - නලභන්ති බුධා අපි
සෙය්‍යත්ථිකොව - සික්ඛෙය්‍ය නෙවා පූජාදි කාරණා''[15]

ලොව සෑම සත්ත්වයෙකුගේ ම සෑම කටයුත්තක් ම බහුල වශයෙන් කර්මය පදනම් කරගෙන සිදුවන බව බෞද්ධ ඉගැන්වීම යි. එම නිසා කර්මය, සතුව ප්‍රබල බලාධිකාරයක් ඇති බව ඉගැන්වේ. මේ බව ශිල්ප ශාස්ත්‍රය හා සමාන මිත්‍රයෙක් නොමැත. රෝගාබාධ හා සමාන සතුරෙක් නොමැත. තමාට තමා හා සමාන ප්‍රේමයක් නොමැත. එපරිද්දෙන් ම කර්මය හා සමාන බලයක් ද නොමැති බව යනාදි වශයෙන් ලෝක නීතියෙහි දැක් වේ.

''නත්ථි විජ්ජා සමං මිත්තං - න ච බ්‍යාධි සමො රිපු
නච අත්ත සමං පෙමං - නච කම්ම සමං බලං''[16]

අතීතය, වර්තමානය සහ අනාගතය නිසිපරිදි කළමනාකරණය කර නොගතහොත් එම තුන් කාලය තුළ ම ශෝක වීමට සිදු වේ. මෙම කාල තුනෙහි නිවැරදි ව කටයුතු කිරීම යනු 'ජීවත් වීම' වශයෙන් ද හැඳින් විය හැකිය. අනාගතයේ පහළ වීමට නියමිත අනතුරක් පිළිබඳ ව කලින් ම අවබෝධ කරගෙන කලින් ම එය දුරු කරගැනීමත් පැමිණි උපද්‍රවය අවබෝධ කරගෙන ඉන් නිර්භීත ව මිදීම යනු පණ්ඩිත පුද්ගලයාගේ ලක්ෂණයක් බව කවිදප්පණනීතියෙහි පහත පරිදි දැක්වේ.

''අනාගත භයං දිස්වා - දූරතො පරිවජ්ජයෙ
ආගතඤ්ච භයං දිස්වා - අභීතො හොති පණ්ඩිතො''[17]

අතීත, වර්තමාන, අනාගත කාලත්‍රය කෙරෙහි කල්පනාකාරීව කටයුතු කිරීම සෑම කෙනෙකුගේ අභිවෘද්ධිය පිණිස හේතු වන බව ඉන් ගම්‍ය වේ. විවිධාකාර වූ කුල

ගෝත්‍ර ආදි වූ කරුණුවලින් තවත් අයෙකු පහත් කොට තවත් අයෙකු ඉහළ යෑම සෑම ස්ථානයක ම පවතින සාමාන්‍ය කාරණයකි. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණාදි කුල ගෝත්‍රයන්හි සිටිමින් කෙනෙකු ශ්‍රේෂ්ඨ වනවට වඩා යම් කෙනෙකුට ශිල්ප ශාස්ත්‍රානුකූලව ස්වකීය චින්තනය හා චරණය සකසා ගත හැකි වන්නේ නම් ඔහුට දෙව් මිනිසුන් පවා ගරු කරන බව බෞද්ධ නීති සම්ප්‍රදායෙහි දැක්වේ. මිනිසුන් අතර ක්ෂත්‍රියයා ශ්‍රේෂ්ඨ වන්නේ කුල ගෝත්‍රය අනුව වුව ද විජ්ජාචරණ සම්පන්න ගුණයෙන් යුතු තැනැත්තා එයට වඩා සියලු දෙව් මිනිසුන්ගෙන් ම ශ්‍රේෂ්ඨ වන බව බෞද්ධ නීති සංකල්පයෙහි ඉගැන් වේ.

''ඛත්තියො සෙට්ඨො ජනෙ තස්මිං - යෙ ගොත්ත පටිසාරිනො
විජ්ජාචරණ සම්පන්නො - සො සෙට්ඨො දෙවමානුසෙ''[18]

අනෙක් පෙරදිග නීති පද්‍ය සංග්‍රහ අතර දාන සංකල්පය විරල ය. බුදුසමය දානය හෙවත් දන්දීම දසපාරමිතා, දසබල, සතර සංග්‍රහවස්තු ආදි සෑම වැදගත් ධර්ම වර්ගීකරණයන්හි දී ම ප්‍රමුඛ කොට සලකා ඇත. දමනය කිරීමට අපහසු අය දමනය කරන්නේ දානය මඟිනි. දානය සියලු කටයුතු සිදුකර දීම ළඟා කරයි. 'දානය ප්‍රිය වචනය, දන් නොදෙන අය දන්දීමට හුරු කිරීම ආදි උසස් තත්ත්වයට පත් කරවන්නේ ය.' යන දානය ප්‍රගුණ කිරීමෙන් ජනිත වන ප්‍රතිඵල බව මහාරහ නීතියෙහි දැක්වේ. පාලි නීති ග්‍රන්ථ සාහිත්‍යයෙහි අනන්‍ය ලක්ෂණයක් වශයෙන් දැක්වෙන දානය පිළිබඳ ව තත් සදුපදේශය පහත දැක් වේ.

''අදන්තදමනං දානං - දානං සබ්බත්ථ සාධකං
දානෙන පිය වාචෙන - උන්නමන්ති නමන්ති ච''[19]

මෙසේ සම්බුද්ධ දේශනාවන් ද පදනම් කරගෙන බෞද්ධයාගේ මෙලොව පරලොව සාන්සාරික චින්තනය සහ චරණය සඵලවත් හා ගුණාත්මක කිරීමේ සත්ක්‍රියාවලියක් වශයෙන් බෞද්ධ නීති සංකල්පය දැක්විය හැකිය.

**ආන්තික සටහන්**

1 මේධානන්ද හිමි, දේවාලේගම, 2012, *බෞද්ධ සංස්කෘතිය*, කතෘ ප්‍රකාශනය, 81 පිටුව.

2 "අනුජානාමි භික්ඛවෙ රාජානං අනුවත්තිතුං", *මහාවග්ගපාළි i*, 348 පිටුව.

3 විජයතුංග, හරිස්චන්ද්‍ර, 1998, *නීති නිඝණ්ඩුව*, (සංස්) ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ: ප්‍රස්තාවනාව.

4 චන්දවිමල හිමි, රේරුකානේ, 2005, *බුද්ධ නීති සංග්‍රහය*, ශ්‍රී විනයාලංකාරාමය, පොකුණුවිට: 27 පිටුව.

5 මේධානන්ද හිමි, දේවාලේගම, 42 පිටුව

6 "සබ්බෙ තසන්ති දණ්ඩස්ස - සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ", (ධම්මපදය, දණ්ඩ වග්ගය.)

7 වික්‍රමරත්න, පරාක්‍රම, ශ්‍රි, 2000, ''බෞද්ධ සදාචාර විෂයෙහි පැනෙන නීති විද්‍යාත්මක ප්‍රස්තුත''

සම්භාෂා, සංස්. ඩබ්. ධම්මරක්ඛිත හිමි, අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල, කොළඹ: 264-285 පිටු.

8 එම

9 මහින්ද හිමි, ඇහැලේපොල, 2016, *පාලි නීති ග්‍රන්ථ සාහිත්‍යය*, ගොඩගේ සහ සමාගම, මරදාන: 16 පිටුව.

10 චන්දවිමල හිමි, රේරුකානේ, 2005, සංඥාපනය.

11 මහින්ද හිමි, ඇහැලේපොල, 2016, 58 පිටුව.

12 චතුරාරක්ඛාදීපනී, *බුද්ධානුස්සති නිද්දේසය*, 10 ගාථාව, 1999, Catta Sangayana CD ROM, Vipassana Research Institute, India.

13 එම, 11 ගාථාව.

14 චතුරාරක්ඛාදීපනී, *අප්පමාද වග්ග පකිණ්ණක නිද්දේස*, 92 ගාථාව.

15 *කවිදප්පනනීතිය*, 76 ගාථාව.

16 *ලෝකනීති*, 23 ගාථාව.

17 *කවිදප්පනනීති*, පණ්ඩිත කාණ්ඩය, 135 ගාථාව.

18 *කවිදප්පනනීති*, 76 ගාථාව.

19 *මහාරහ නීතිය*, 186 ගාථාව.